# ධාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

41 වන කාණ්ඩය | 03 වන කලාපය | 2025 මාර්තු කලාපය


# ජාත්‍යන්තර කාන්තා දින සැමරුම









පුරා වසර 40ක කාලයක් මුළුල්ලේ කාන්තාවන් හා ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කැප වී සිටින ධාබිඳු සාමූහිකයේ මෙවර ජාත්‍යන්තර කාන්තා දින සැමරුම මාර්තු මස 09 වන ඉරු දින ඇවරිවත්ත ඔරලෝසු කණුව අසලදී නිහඬ විරෝධතාවයක් ලෙසින් පවත්වනු ලැබූයේ "සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමුන් උදෙසා අයිතීන්, සමානාත්මතාවය, බලගැන්වීම" යන මූලික තේමාව හොවා දක්වමිනි.

ධාබිඳු සාමූහිකයේ වර්තමාන විධායක අධ්‍යක්ෂිකා චමිලා තුෂාරි මහත්මිය ප්‍රධාන කොටගත් මෙම නිහඬ විරෝධතාවයට ධාබිඳු සාමූහිකයේ සෙසු නිලධාරී මණ්ඩලයද, තවත් සබැඳි කාන්තා සංවිධානයන් හා වෘත්තීය සමිතීන්ද අත්වැල් බැඳ ගැනීම කැපී පෙනුණු අතර බහුතර සහභාගීත්වය කටුනායක හා බියගම නිදහස් වෙළඳ කලාපවල වැඩ කරන කාන්තා ප්‍රජාව වීම මෙහි විශේෂත්වයයි.

2 වන පිටුවට...

## ඇතුළු පිටු


03 පිටුව - බර අදින ගැහැණුන්
04 පිටුව - ඇය
05-06 පිටු - අපේ වැඩ
07-08 පිටු - ජාතික හා ජාත්‍යන්තර වැඩ
09 පිටුව - අපේ අයිතිවාසිකම් ගැන අපි දැනුවත් වෙමු
10 පිටුව - සිතුවිල්ල/ප්‍රහේළිකාව
11 පිටුව - කවි පිටුව/විදෙස් පුවත්

## ඩාබිඳු සාමූහිකය

221, වෙළඹඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : dabindu collective sri lanka
Web : www.dabinducollective


# ජගත් කාන්තා දිනයේ අභියෝග

වසර 114 ක අතීතය සිහිපත් කිරීමට ගෝලීය වශයෙන් දිනාගත් ආර්ථික, සමාජ, දේශපාලන හා සංස්කෘතික වශයෙන් ළඟා කරගත් ජයග්‍රහණයන් සැමරීම මාර්තු 08 වන දිනට සමරනු ලබයි. මේ වන විට සමාජභාවීය සමානාත්මතාවය, ප්‍රජනන සෞඛ්‍ය අයිතීන් හා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ අවධානය ලක් කරයි. විශේෂයෙන් ශ්‍රම බලකායේ නිරත කාන්තාවන් ජීවිත් වීමට සරිලන වැටුප්, යහපත් වැඩ පරිසරයත්, යහපත් නීති මෙන්ම සුරකුම් ආශ්‍රිත වැඩ ශ්‍රමයන් ලෙස අර්ථ ගැන්වීමේ අවධානය බලාපොරොත්තු වෙමින් විරෝධතාවයේ නිරත වේ.

කෙසේ වෙතත් කාන්තාවන් පිළිබඳ තිබෙන දත්ත දිනෙන් දින ඔවුන්ගේ අයිතීන් ආපස්සට ඇද දමන තත්ත්වයන් ගෝලීය වශයෙන් මෙන්ම කලාපීය වශයෙන්ද දැක ගැනීමට හැකි වේ. නායකත්වයට කාන්තාවන් පැමිණීම, තීන්දු ගැනීම, දේශපාලනික නායකත්වයේ තිබෙන යල් පැන ගිය නීති රාමු ඇයව සමාජ ක්‍රියාවලියෙන් බැහැර කිරීමට සමත්ව ඇත.

ජාත්‍යන්තරයේ අවධානය දිනා ඇති ලෝකයේ ධනවතුන්ට ඇඳුම් මැසීම වෙනුවෙන් පෙරමුණ ගෙන කටයුතු කරන අති බහුතර කාන්තාවන් ශ්‍රම බලකායේ ගොදුරු බවට පත්ව සිටියි. දිනාගත් පැය අටක සේවය අහෝසි කරමින් දින 5 වැඩ සති හඳුන්වා දෙමින් හාම්පුතාගේ කොටස තව තවත් වර්ධනය කරගැනීමට පවතින නීති අමු අමුවේ උල්ලංඝනය කරයි. වැඩබිම් තුළ, මඟතොට හා නේවාසිකාගාරවල වන හිංසනයන් දිනෙන් දින වැඩි වෙමින් පවතී. සංගමයේ නිදහස, සාමූහික කේවල් කිරීම තවදුරටත් අහිමි කරමින් සමාජ සංරක්ෂණය, රැකියා සුරක්ෂිතභාවය, ගරුත්වය සම්බන්ධයෙන් පවතින කතිකාවන්වල අරුත් සේවකයන්ගෙන් ගිලිහී යන තැනට පත්ව ඇත. ILO සම්මුතීන්, CEDAW ප්‍රඥප්ති, CSW 69 සම්මුතීන් වර්තමානයේ ගෝලීය වශයෙන් අවධානයට ලක් වූ කාලයක ජාත්‍යන්තර කාන්තා දිනය සමරන මේ මොහොතේ එම සම්මුතීන්වල නියම අයිතිය භුක්ති විඳීමට හැකි, සියලු දෙනා වෙනුවෙන් යහපත් නීතිරීති, සම්මුතීන් රැගෙන හෙටක් වෙනුවෙන් පෙළ ගැසෙමු.

1 පිටුවෙන්... **ජාත්‍යන්තර කාන්තා දින**

කාන්තා සංවිධානයක් සහ වෘත්තීය සමිතියක් ලෙස 2025 ජාත්‍යන්තර කාන්තා දිනය සමරන ඩාබිඳු සාමූහිකයේ අප අවධාරණය කරන්නේ කම්හල්, වතු, ගොවිබිම් සහ මුහුදු වලත්, එහි සීමාවන් ඉක්මවාත් යන කාන්තා ශ්‍රමයට ගරුත්වය, ආරක්ෂාව, ආදරය, අයිතීන් සහ සමානාත්මතාවය සවිබල ගැන්වීමයි. එය ඉස්මතු කරමින් අප විසින් සමාජ මාධ්‍යයට මුදා හරින ලද ජාත්‍යන්තර කාන්තා දින ප්‍රකාශය මෙන්ම, නිහඬ විරෝධතාවය අතරතුර දී පණිවිඩ පුවරු මඟින් කාන්තාවන්ට හිමි විය යුතු අයිතීන් ප්‍රදර්ශනය කිරීමත් මෙහි පැසසුම් ලැබූ අංගයන් විය.

කාන්තාවන්ගේ ශක්තිය, කැපවීම සහ දායකත්වයෙන් සමාජය, ආර්ථිකය සහ පවුල් ජීවිතය අර්ථවත් හා ගෞරවනීය වන නිසාම සෑම සමාජයකම කාන්තා අයිතීන් සුරකීම සහ ඔවුන්ගේ සමානාත්මතාවය ලබා දීම යනු අත්‍යාවශ්‍ය කාරණයකි. එබැවින් ඩාබිඳු සාමූහිකය වන අපි, කාන්තාවන් අතහැර දමා ඇති ගෝලීය නව ලිබරල් පාලනාධිකාරියෙන් ඔබ්බට අරගල කිරීමටත්, කාන්තාවන්ගේ සාමූහික බලය සහ ඔවුන්ගේ දායකත්වයන් සෑම මට්ටමකින්ම අගය කරන ලෝකයක් ගොඩනැඟීමටත් කැප වී සිටිමු.









# බර අදින ගැහැණුන්

දෙවියන් සහ යක්ෂයන් මූලික කරගත් සෑම කතන්දරේකම ගැහැණුන් සෑමදාම යක්ෂයන්ට සහ දෙවියන්ට එරෙහිව සටන් කරයි. සැබැවින්ම ඔවුන් සමාජයේ කොඳු නාරටිය ලෙස පෙන්වා දිය හැකිය. පෞද්ගලික මෙන්ම වෘත්තීය ජීවිතය අභියෝග ජය ගනිමින් ඉදිරියට යන්නට ඔවුන් වෙර දරයි. ගැහැණිය නිතරම සිය නිවසේ සතුට සාමය පෝෂණය කරයි. එමෙන්ම වෘත්තීය ජීවිතය ගොඩනගා ගැනීමට පොර බදියි. එදිනෙදා ජීවිතයේ විවිධ වූ හැල හැප්පීම්වලට මුහුණ දුන් ගැහැණුන් රූක්ෂ වෘක්ෂයන් මෙන් ඔරොත්තු දීමේ හැකියාවන් ඉස්මතු කරයි. විටෙක දියණියක් විටෙක බිරිඳක් මවක් ගෘහණියක් ලෙස විවිධ චරිත නිරූපණය කරන ඇය පෙරළිකාර චරිතයක් ලෙසද පෙන්වා දිය හැකිය. එහෙත් ඔවුන්ගේ කැපකිරීම් ඇගයුමට ලක් වෙනවාද යන්න ගැටළුවකි.

කුඩා කල සිටම බොහෝ කාන්තාවෝ වගකීම් හිස දරා සිටින පිරිසක් වෙති. එමෙන්ම ගැහැණිය තම පීඩාවන් යටපත් කර ගනිමින් සිය මානසික සුවතාව පිළිබඳවත් නොසිතා අන් අයගේ යහපැවැත්ම උදෙසාම කටයුතු කරයි.

**"අයස ළඟදි මා ළඟ සිටි යසවතිය සසිරිබර සැපත නොම දුටු සිරිමතිය**

**නිරසකුල බොජුන් වැළඳූ රසවතිය කටුක වැල් යහන සැරසූ පතිවතිය"** (යමුනා මාලනී - කුලීමාලිගා)

ශ්‍රී ලංකා සමාජයේ හුදෙක් ගැහැණුන්ට මෙය සුලභය. බොහෝ දුක් කම්කටොළු හිතින් දරාගෙන තම වගකීම් අන් අයට ඉටු කිරීමට ඇය වෙහෙසෙන්නීය. එහෙත් සියල්ලටම වඩා සිය මානසික සුවතාව වැදගත් නොවේද යන්න ගැටලුවකි.

**"පිච්චිලා ගිය ගස්වලත් මැරෙන්නෙ නැතුව දළු එන කාලයක් එනවා. ජීවිතෙත් එහෙමයි. දවසක වසන්තයේ දළු නැගෙන කාලයක් එනවා".** ගැහැණිය යනු සමාජයේ ශක්තිය සහ ශෝභාවයි. ඔවුන්ගේ කැපකිරීම් ඔවුන්ගේ බුද්ධිය සහ සමාජයට කරන මෙහෙවර හොවා දැක්විය යුතුමයි. ඔවුන් සිය ආත්ම විශ්වාසයෙන් කැපවීමෙන් ජීවිතය ගොඩනගන අතර ඔවුනට නිසි ගෞරවය ආරක්ෂාව සහ පිළිගැනීම හිමි විය යුතු නොවේද?

අධ්‍යාපනය යන්න ගැහැණු අපගේ නිදහසට තෝතැන්නක් ලෙස පෙන්වා දිය හැකිය. එමඟින් ඔවුන්ගේ පෞරුෂය මෙන්ම පරම්පරාවෙන් පරම්පරාවට කරපින්නා ආ පීඩනය දුක් කම්කටොළු වළක්වා ඔවුන්ගේ අභිමතයට අනුව ඔවුන්ගේ කුසලතා හොවා දැක්වීමට අවස්ථාවන් සලසා දෙන කදිම තෝතැන්නක් ලෙස පෙන්වා දිය හැකිය. මේ මඟින් පුරුෂයන්ට සමානවම සමාජයේ වටිනාකමක් ලබා ගැනීම සඳහා අවශ්‍ය කුසලතා සහ මනෝභාවයන් පවත්වා ගැනීමට කාන්තාවන්ට හැකිවේ.

ශ්‍රී ලංකාවේ ගැහැණු පිරිස දේශපාලන වාණිජ ව්‍යාපාර සංගම් සහ සංවිධානයන්හි නායකයන් ලෙස කටයුතු කිරීමට පෙරටු වූ අවස්ථාවන් ඉතිහාසයේ මෙන්ම අදත් දක්නට ලැබේ. ගැහැණුන්ගේ චරිතය සමාජයේ බලවත් අංගයක් ලෙස හොවා දැක්විය හැකි බව මං මීට පෙරද සඳහන් කළෙමි. ආත්ම විශ්වාසය කාර්යබහුලත්වය සහ එඩිතරකම මෙයට හේතුවක් ලෙස පෙන්වා දිය හැකිය. විශ්වාසය සහ දිරිමත් කිරීම ඔවුනගේ අභ්‍යන්තර ශක්තිය ඉස්මතු කිරීමට අත්වැලක් ලෙස දැක්විය හැකිය.

**කවීශා වන්නිනායක**



# ඇය

ඇත අතීතයේ සිට කාන්තාව පිළිබඳ ඔබ නොයෙකුත් දෑ අසා ඇත. කියවා ඇත. ඒ පුරාණයේ පැවති සංස්කෘතිය අනුව ඇගේ රූ සපුවේ වර්ණාවය නොයෙකුත් ප්‍රස්ථා පිරුළු වලටද සමාන කර ඇත. අතීතය දෙස හැරී බැලුවහොත් බෞද්ධ ආගම තුළ ඇය ඉදිරියෙන් සිට විශාල මෙහෙවරක් කර ඇත. නමුත් ඇය පිළිබඳව නිවැරදිව වටහා ගැනීමට අප සමාජය දුර්වල වී ඇත. අප වසරකට වරක් එක් දිනයක් පමණක් වෙන් කළත්, සෑම දිනකම ඇය පිළිබඳව විමසා බැලීම අප යුතුකමකි. මන්ද අද පවතින සමාජය තුළ දිනෙන් දින සිදුවන සාපරාධී ක්‍රියා නිසාය. ලොවට ජීවය දෙන්නේ ඇයයි. දහසක් කම්කටොළු උසුලමින් ජීවන යාත්‍රාව පදවන්නේ ඇයයි.

ලෝකයේ සෑම තැනකම සියලු කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහිව සිදුවන සියලුම රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි පවතින ප්‍රචණ්ඩත්වය, ලිංගික සූරා කෑම, කාන්තා දූෂණ නැවත හිස ඔසවන ප්‍රවණතාවයක් මේ වන විට අප රට තුළ ද දක්නට ඇත. මෙයට මූලික හේතුව වී ඇත්තේ රට තුළ පවතින විවිධ නම් වලින් යුතු මත්ද්‍රව්‍යයයි. එම නිසා දරුවන්ගේ රැකවරණය සඳහා දැඩි අවධානයක් යොමු කිරීමට ද සිදුවී ඇත.

වත්මන් සමාජය තුළ පුරුෂයින් සමඟ ගැටෙමින් ඕනෑම ක්ෂේත්‍රයක් තුළ පුරුෂයන් සමඟ වැඩ කිරීමට ඇති හැකියාවන් මේ වන විට ඉදිරියට පැමිණ ඇත. මෙවර ජාත්‍යන්තර කාන්තා දිනය දවසේ කාන්තාව නියෝජනය කරමින් ගුවන්ගත වෙනවා අපි දුටුවෙමු. එය අද කාන්තාව පෙරට වඩා ධෛර්යමත්ව ඉදිරියට පැමිණ ඇති බව හුවා දැක්වීමකි. එමෙන්ම දේශපාලන ක්ෂේත්‍රයේ, රැකියා පරිපාලනයේ, අධ්‍යාපන, විධායක ක්ෂේත්‍ර, රැකියා පාලන ක්ෂේත්‍ර තුළ කාන්තා නියෝජනය දක්නට ඇත.

වර්තමානයේ කාන්තාව අධික ලෙස කාර්යබහුල වී ඇත්තේ රට තුළ පවතින ආර්ථික උද්ධමනය නිසාය. හිමිදිරි පාන්දර අවදිවන ඇය රාත්‍රියේ නින්දට යනතුරු ගෙදර වැඩ කරන්නේ රැකියාවද කරමිනි. ඇය මවක් නම් පවුලේ දියුණුව වෙනුවෙන් කැපවෙයි. ඒ ඇය ලද ශක්තිය ධෛර්යය නිසාය.

පෙර කාලයේ ඉන්දියාව වැනි රටවල ගැහැණු දරුවෙකු ඉපදීම අවාසනාවන්ත ලෙස සැලකුවද වර්තමානයේ එය පහව ගොස් ඇත. අප රටේ වුවද ගැහැණු දරුවන් තුන හතරක් සිටිනවා නම් එය පවුලට බරක් සේ සැලකේ.

ඇය විටෙක යෙහෙළියකි. සහෝදරියකි. පෙම්වතියක මෙන්ම මවකි. ඇයට වර්තමානයේ විවිධ ගැටලුවලට මුහුණ පෑමට සිදුවී ඇත. එමෙන්ම පෙරට වඩා නිවස තුළ, බස් රථ තුළ, රැකියා ස්ථානවල, දුම්රිය තුළ ඇයව හිංසනයට, පීඩනයට ගොදුරු වෙති. එසේම කුඩා දැරියන් පවා අපයෝජනයට ලක් වෙමින් පවතී. මෙවැනි සිදුවීම් රට තුළ බොහෝ සිදු වූවත් එයට විරුද්ධව ඇති අණ පනත් තිබුනත් ඒවා නිලබලයට යටත්ව පවතින බව පැවසිය යුතුය.

කෙසේ නමුත් අද සමාජය තුළ වෙසෙන කාන්තාවන් අධ්‍යාපන සුදුසුකම් ලබා උසස් රැකියාවල සේවය කරති. රටේ ජීවනාලිය වන ඔවුන් ගැන දැනට වඩා ගරුත්වයෙන් සමානාත්මතාවයෙන් සැලකිය යුතු බව පැවසිය යුතුය.

එච්.අයි.සමන්මලී

# පෝෂ්‍යදායි ආහාර වේලක් - පොදු කුස්සිය







ජනවාරි 19 වන දින ඩාබිඳු සාමූහිකය විසින් ඇගළුම් ක්ෂේත්‍රයේ සේවයේ නියුතු සේවක සේවිකාවන් සඳහා ප්‍රජා මුළුතැන්ගෙයි වැඩසටහන් තුනක් කිලිනොච්චි, වවුනියා සහ කටුනායක යන ප්‍රදේශවල දී දියත් කරන ලදී. මෙහි දී කර්මාන්තශාලා වල සේවයෙහි යෙදෙන සේවක සේවිකාවන් තුන්සිය දෙනෙකු සඳහා පෝෂ්‍යදායි කෑම පාර්සල් බෙදා දීම අරමුණු කරන ලද අතර ආහාර සුරක්ෂිතභාවයට පමණක් සීමා නොවී ප්‍රජාවන් තුළ ඇති බැඳීම් ශක්තිමත් කිරීමටද මෙය හේතු විය.

# සහෝදරත්වයේ කවය



ඇඟළුම් කර්මාන්තයේ සේවිකාවන්ගේ ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍යය අයිතීන් වෙනුවෙන් පෙනී සිටින ඩාබිඳු සාමූහිකය කිලිනොච්චි, වවුනියා සහ ගම්පහ දිස්ත්‍රික්ක මූලික කරගනිමින් පවතවනු ලබන සහෝදරත්වයේ කවය වැඩසටහනේ පළමු අදියර 2025 ජනවාරි මස 05 වන දින සහ 26 යන දෙදින ගම්පහ දිස්ත්‍රික්කයේ කටුනායක සහ බියගම ආයෝජන ප්‍රවර්ධන කලාප මූලික කරගනිමින් පවත්වන ලදී. ඩාබිඳු තුළින් ගොඩනැගුණු නව නායකත්වයන් ඔස්සේ සාමාජිකයන් රැස් කරගනිමින් පවත්වනු ලැබූ මෙම වැඩසටහනේදී සාකච්ඡා කරනු ලැබුවේ පළමු ඔසප් දිනයේ අත්දැකීම් සම්බන්ධවයි. ආයෝජන ප්‍රවර්ධන කලාපයේ සේවය කරනුයේ විවිධ ප්‍රදේශ තුළින් සංක්‍රමණය වූ පිරිසක් නිසාවෙන් පළමු ඔසප් අත්දැකීම සහ සිරිත් විරිත් විවිධාකාර ස්වරූපයෙන් ඉදිරිපත් විය.

මෙම සිරිත් විරිත් මොනවාද, එම සිරිත් විරිත් වල පදනම කුමක්ද, එම සිරිත් විරිත් පැවතගෙන එන්නේ කෙසේද සහ පවතින විවිධ මතයන් සාකච්ඡා කිරීම මෙහි දී සිදු කරන ලදී.

සහෝදරත්වයේ කවය වැඩසටහනේ දෙවන අදියර 2025 පෙබරවාරි 09 වන දින කටුනායක සහ බියගම දී පවත්වන ලදී. මෙහිදී මූලික වශයෙන් ඔසප් වීම යනු කුමක්ද, ඔසප් වීම සිදුවන්නේ කෙසේද ආදී කරුණු රූප සටහන් භාවිතයෙන් පැහැදිලි කරනු ලැබූ අතර ඔසප් දිනයන් තුළ භාවිතා කරන නිෂ්පාදන සහ ඔසප් දරිද්‍රතාවය පිළිබඳව ද සාකච්ඡා කරන ලදී. එසේම ඔසප් දින කළමනාකරණය සහ ඒ සඳහා පවුල, රැකියා ස්ථානය, සමාජය තුළින් ලැබෙන සහයෝගය පිළිබඳව සාකච්ඡා කරන ලදී. එමෙන්ම මෙහි තුන්වන අදියර මාර්තු 02 වැනිදා කටුනායක සහ බියගම දී පවත්වන ලදී. එහිදී ස්ත්‍රී ප්‍රජනන පද්ධතියේ කොටස්, කන්‍යාභාවය සහ කන්‍යාපටලය අතර ඇති මත විශ්වාස සහ ඔසප් නිෂ්පාදන පිළිබඳව තවදුරටත් සාකච්ඡා කරන ලදී.



# සෞඛ්‍ය පිළිබඳ කුසලතා සංවර්ධන වැඩමුළුව



ශ්‍රී ලංකාවේ ඇඟළුම් කම්හල් සේවිකාවන්ගේ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය අයිතිවාසිකම් සහ ගෞරවය වෙනුවෙන් පෙනී සිටීමේ ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලබන සෞඛ්‍ය පිළිබඳ කුසලතා සංවර්ධන වැඩමුළු කටුනායක සහ බියගම නිදහස් වෙළඳ කලාප මූලික කරගනිමින් 2025/02/16 සහ 2025/03/09 යන දිනයන් හි තුන්වන සහ හතරවන සැසි කටුනායක දී පවත්වන ලදී. එයින් ඔසප් දිනය, ඔසප් චක්‍රය ආශ්‍රිත සිදු වන ක්‍රියාවලිය සහ කාන්තාවකගේ සරු කාලය පිළිබඳවත් ඔසප් දින කළමනාකරණය සහ සනීපාරක්ෂාව පිළිබඳවත් විවිධ ක්‍රියාකාරකම් ඔස්සේ සාකච්ඡා කල අතර වැඩසටහන් සම්පත්දායිකා ලෙස ග්‍රාස්රූට් ට්‍රස්ට් සංවිධානයේ අධ්‍යක්ෂිකා පබා දේශප්‍රිය කටයුතු කරන ලදී.

මෙම සෞඛ්‍ය පිළිබඳ කුසලතා සංවර්ධන වැඩමුළුවේ කිලිනොච්චි සහ නීතිඥ ප්‍රදේශයේ පළමු පුහුණු සැසිය කිලිනොච්චි සෞඛ්‍යය වෛද්‍ය නිළධාරි කාර්යාලයේ කාන්තා හා ළමා අංශයේ වෛද්‍ය ඒ. ඩිරෝනි මහත්මිය විසින් 2025/02/23 වන දින පවත්වන ලදී. උතුරු ප්‍රදේශයේ ග්‍රාමීය මට්ටමින් පැවැත්වීමට නියමිත සහෝදරත්ව කව වැඩසටහන්වල ආරම්භක අදියර මෙසේ සනිටුහන් කරන ලදී.



# කම්කරු අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

මාර්තු මස 02 වන දින ඇඟළුම් ක්ෂේත්‍රයේ සේවක සේවිකාවන් 25 දෙනෙකු සඳහා කම්කරු අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් කිලිනොච්චියේ දී පවත්වන ලදී. මෙම වැඩසටහන මෙහෙයවනු ලැබුයේ වවුනියා සර්ණියා රාසුතන් මහත්මිය විසිනි. මෙහිදී කම්කරු නීතිය, කම්කරු නීතිය ක්‍රියාත්මක වන උසාවි සහ කම්කරු අයිතිවාසිකම් උල්ලංඝණය වුනොත් සිදුකළ යුතු දේවල් පිළිබඳව ගැඹුරින් සාකච්ජා කරන ලදී.



# ඇම්නෙස්ටි ඉන්ටනැෂනල් මහලේකම්වරිය ශ්‍රී ලංකාවට පැමිණෙයි



2025 පෙබරවාරි 28 වන දින, වෘත්තීය සමිති සහ කම්කරු අයිතිවාසිකම් සංවිධාන හමුවීම සඳහා ඇම්නස්ටි ජාත්‍යන්තර සංවිධානයේ මහලේකම්වරිය ඇග්නස් කැලමාර්ඩ් ශ්‍රී ලංකාවට පැමිණියාය. ඇයගේ සංචාරයේදී කම්කරු අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරන සංවිධාන සමඟ ජීවත් වීමට සරිලන වැටුප් නොමැතිකම, සමාජභාවය මත පදනම් වූ වැටුප් පරතරය, සහ වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂක ගැටළු ඇතුළු ගැටළු කිහිපයක් ඉස්මතු කළහ. ඩාබිඳු සාමූහිකය අවධාරණය කළ ගැටළුවක් වූයේ වෛද්‍ය අනුමැතියකින් තොරව කම්කරුවන්ගේ ඔසප් වීම ප්‍රමාද කරන පෙති සහ ආතතිය සඳහා ඖෂධ සපයන කර්මාන්තශාලාවල වෙන උල්ලංඝනය, කාන්තා සේවිකාවන්ට හිරිහැර කිරීම සහ සංගමයේ නිදහස සීමා කිරීම ද සාකච්ඡා කෙරිණි. ප්‍රවාහනය වැනි කාන්තා ආරක්ෂක අවශ්‍යතා කර්මාන්තශාලා සැපයීම සීමා කිරීම් උපුටා දක්වමින්, ඩාබිඳු සාමූහිකයේ චමිලා තුෂාරි සමාජභාවය මත පදනම් වූ වැටුප් පරතරය පිළිබඳ ප්‍රශ්නය මතු කළාය. කම්කරු ප්‍රතිපත්ති සම්පාදනයේ දී නොසලකා හරින කාන්තාවන්ගේ වැටුප් රහිත සුරැකුම් වැඩවල නොපිළිගත් දායකත්වය ද ඇය ඉස්මතු කළාය. කිලිනොච්චි සහ වවුනියා කර්මාන්තශාලාවල සේවකයින් මුහුණ දෙන දෙමළ අනන්‍යතාවය මත පදනම් වූ වෙනස්කම් කිරීම්වලට එරෙහිව ද ඇය අදහස් ප්‍රකාශ කළාය. ශ්‍රී ලංකාවේ කම්කරු කාන්තාවන් අඛණ්ඩව මුහුණ දෙන අභියෝග පිළිබඳව මෙම සංචාරය හරහා ජාත්‍යන්තර මානව හිමිකම් මුරකරුවෝ වන ඇම්නස්ටි ආයතනයට අවධාරණය වූහ.

# ස්ත්‍රීවාදී ක්‍රියාකාරීත්වය පිළිබඳ ක්‍රියාගේ සහ ඩාබිඳුගේ අත්දැකීම් බෙදාගැනීම

දකුණු ආසියාව සඳහා ක්‍රියා හි (CREA) කාන්තා නායකත්වය, ව්‍යාපාර ගොඩනැගීම සහ අයිතිවාසිකම් ආයතනයේ සහභාගිවන්නන්ට ඩාබිඳු සත්කාරකත්වය සැපයීය. ශ්‍රී ලංකාවේ සහ කලාපයේ කාන්තා හා කම්කරු ව්‍යාපාරයේ ඩාබිඳු හි දිගු ක්‍රියාකාරීත්වයේ ඉතිහාසය අප බෙදා ගත්තේය. මෙම රැස්වීම දකුණු ආසියාවේ ස්ත්‍රීවාදී ක්‍රියාකාරීත්වය පිළිබඳ අදහස් සහ අත්දැකීම් හුවමාරු කර ගැනීමට ප්‍රබෝධමත් වේදිකාවක් සැපයීය.



# නිදහස් වෙළඳ කලාපය තුළ සහ ඒ අවට ජාත්‍යන්තර කාන්තා දින සැමරුම්

2025 මාර්තු 7 වන දින, ඩාබිඳු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් උත්සවයට සහභාගි විය. මෙම අවස්ථාව ග්‍රාමීය ආර්ථිකය, කම්කරු අයිතිවාසිකම් සහ LGBTQ+ ගැටළු ඇතුළු විවිධ අංශවල කාන්තාවන්ගේ අරගල බෙදා ගැනීමට වේදිකාවක් සපයන ලදී. මෙම ක්ෂේත්‍රවල කාන්තාවන් මුහුණ දෙන අද්විතීය අභියෝග පිළිබඳව සහභාගිවන්නන් සාකච්ඡා කළ අතර, අනෙකුත් සමාජ ගැටළු සමග සමාජභාවයේ අසමානතාවයේ ඡේදනයන් ඉස්මතු කළහ.

කම්කරු සංවිධාන හා එක්ව ඩාබිඳු සාමූහිකය කටුනායක ප්‍රදේශ ජාත්‍යන්තර කාන්තා දිනය සැමරුම් සහයෝගීතාවයේ ප්‍රබල ප්‍රදර්ශනයක් දුටුවේය. නිවසේ කාන්තා ශ්‍රමයේ තීරණාත්මක ගැටළු සහ කටුනායක නිදහස් වෙළඳ කලාපයේ වඩා ශක්තිමත් දිවා සුරැකුම් පහසුකම් සඳහා හදිසි අවශ්‍යතාවය පිළිබඳව අවධාරණය කරන පා ගමනක් ඇතුළත් RED සංවිධානයේ සැමරුම සමඟ දිනය ආරම්භ විය. ඉන්පසු ඩාබිඳු, ශ්‍රමාභිමානි කේන්ද්‍රයේ සැමරුමට එක් වූ අතර එහිදී ඩිජිටල් සහ සමාජ මාධ්‍යවල කාන්තාවන් මුහුණ දෙන ප්‍රචණ්ඩත්වය පිළිබඳව නාට්‍යය හරහා සේවකයින් සහ ප්‍රේක්ෂකයින් දැනුවත් කරන ලදී. ස්ටෑන්ඩ් අප් මූව්මන්ට් ලංකා විසින් ඇඟළුම් සේවකයින් සඳහා ප්‍රමාණවත් ජීවන වැටුප් නොමැතිකමේ ගෝලීය ගැටලුව ඉස්මතු කරන කෙටි චිත්‍රපටයක් එළි දැක්වීමෙන් පසුව, ඩාබිඳුගේ නිහඬ විරෝධතාවයෙන් දිනය අවසන් විය. මෙම උත්සාහයන් සෑම තැනකම කාන්තා සේවිකාවන් සඳහා දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා පෙනී සිටීම අරමුණු කර ගත්තා වූ කාන්තා දිනයක් විය.






# දකුණු ආසියානු ණය යුක්තිය වෙනුවෙන් සමුළුව

නීත්‍යානුකූල නොවන ණය අහෝසි කිරීමේ කමිටුව (CADTM) 2025 ජනවාරි 29 සහ 30 යන දිනවල දකුණු ආසියානු ණය යුක්තිය වෙනුවෙන් සමුළුවක් පැවැත්වීය. මෙහිදී ශ්‍රී ලංකාවේ ආර්ථික යුක්තිය සඳහා වූ ස්ත්‍රීවාදී එකමුතුව නියෝජනය කරන ඩාබිඳු සාමූහිකයේ මධුලිකා ගුණවර්ධන, ශ්‍රී ලංකාවේ පවතින ණය අර්බුදය පිළිබඳ ස්ත්‍රීවාදී විශ්ලේෂණයක් ඉදිරිපත් කළේය. ණය අර්බුදය කාන්තාවන්ගේ ආර්ථික යහපැවැත්මට අසමාන ලෙස බලපාන ආකාරය සහ රට පුරා ආර්ථික අසමානතාවය උග්‍ර කරන ආකාරය අවධාරණය කරමින්, ආන්තික කාන්තාවන්ගේ ජීවමාන අත්දැකීම් ඇගේ ඉදිරිපත් කිරීම මගින් ඉස්මතු කරන ලදී.




# අපේ අයිතිවාසිකම් ගැන අපි දැනුවත් වෙමු

**කම්කරු** අයිතිවාසිකම් යනු මානව අයිතිවාසිකම් වන අතර සියලුම මිනිසුන් ගරුත්වයෙන් හා අයිතිවාසිකම් වලින් එක හා සමාන බවද නිදහස් පුද්ගලයන් ලෙස උපන් බවද එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් සෑම සාමාජික රජයක්ම පිළිගනු ලැබේ. ඒ අනුව ශ්‍රී ලංකා කම්කරු නීතිය යටතේ ඔබට අවම වැටුප් පරිමාණයන්ට, ආරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න වැඩ කරන පරිසරයන්ට, තමාට හිමි නිවාඩු සහ ප්‍රසිද්ධ නිවාඩු දිනවලට, සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් වලට, වන්දි ලැබීමට, අති කාල වැඩ සඳහා ගෙවීම් ලැබීමට සහ වෘත්තිය සමිතියක් පිහිටුවීමට හා ඊට බැඳීමට අයිතිය තිබේ. මෙම ලිපිය තුළින් ඇඟළුම් ක්ෂේත්‍රයේ සේවය කරන කම්කරුවන්ගේ නිවාඩු අයිතිවාසිකම් පිළිබඳ සාකච්ඡා කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්ත සේවකයින්ගේ නිවාඩු හිමිකම් ප්‍රධාන වශයෙන් පාලනය වන්නේ කර්මාන්තයට විශේෂිත කම්කරු රෙගුලාසි නියම කරන වැටුප් මණ්ඩල ආඥා පනත මගිනි. ඒ අනුව,

## වාර්ෂික නිවාඩු

සේවකයින්ට වසරක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු වැටුප් සහිත වාර්ෂික නිවාඩු දින 14 ක් හිමිවේ. පළමු වසර තුළ වාර්ෂික නිවාඩු ගණනය කරනු ලබන්නේ සම්පූර්ණ කරන ලද මාස ගණන මත පදනම්වය. එය දින 4 සිට 14 දක්වා පරාසයක පවතී.

- ජනවාරි 1 වන දින හෝ ඊට පසු නමුත් අප්‍රේල් 1 වන දිනට පෙර රැකියාව ආරම්භ වන්නේ නම් දින 14.
- අප්‍රේල් 1 වන දින හෝ ඊට පසු නමුත් ජූලි 1 වන දිනට පෙර රැකියාව ආරම්භ වන්නේ නම් දින 10.
- ජූලි 1 වන දින හෝ ඊට පසු නමුත් ඔක්තෝබර් 1 වන දිනට පෙර රැකියාව ආරම්භ වන්නේ නම් දින 7.
- ඔක්තෝබර් 1 වන දින හෝ ඊට පසු රැකියාව ආරම්භ වන්නේ නම් දින 4.

## රජයේ නිවාඩු

සියලුම ව්‍යවස්ථාපිත රජයේ නිවාඩු 8 සඳහා ඇඟළුම් සේවකයින්ට හිමිකම් ඇත. ඒවා නම් දෙමළ තෛපොංගල් දිනය, ජාතික දිනය, සිංහල සහ දෙමළ අලුත් අවුරුද්ද (දින දෙකක්), මැයි දිනය, වෙසක් පුර පසළොස්වක පොහොය දිනය (දින දෙකක්), නත්තල් දිනය වේ. සේවකයෙකුට රජයේ නිවාඩු දිනයක වැඩ කිරීමට අවශ්‍ය නම් ඔවුන්ට දෙගුණයක වැටුප් ගෙවිය යුතු වන අතර හෝ විකල්ප නිවාඩු දිනයක් ලබා දිය යුතුය.

## අමතර නිවාඩු

ඇඟළුම් සේවකයින්ට පුද්ගලික කටයුතු හෝ හදිසි අවස්ථා සඳහා වසරකට දින 7 ක අමතර නිවාඩු සඳහා හිමිකම් ඇත. අමතර නිවාඩු ඉදිරි වසර දක්වා ඉදිරියට ගෙන යා නොහැක.

## මාතෘ නිවාඩු

ඇඟළුම් කර්මාන්තයේ සේවය කරන කාන්තාවන්ට ඔවුන්ගේ පළමු සහ දෙවන දරුවා සඳහා වැටුප් සහිත මාතෘ නිවාඩු දින 84 ක් හිමිවේ. තුන්වන දරුවා සහ ඉන් ඔබ්බට, ඔවුන්ට ලැබෙන්නේ වැටුප් සහිත නිවාඩු දින 42 ක් පමණි. මෙයට සති අන්ත සහ එම කාල සීමාව තුළ රජයේ නිවාඩු දින ඇතුළත් වේ.

# සිතුවිල්ල

වැලන්ටයින් දිනය අප රට තුළට පැමිණියේ විදෙස් රටකිනි. එම දිනය සෑම වසරකම පෙබරවාරි මස 14 වැනිදාට යෙදී ඇත. අප රට තුළ වෙසෙන පෙම්වතුන් හා පෙම්වතියන් රක්ත වර්ණයෙන් යුත් ඇඳුම් පැළඳගෙන එහි හදවත් දෙකක් ඇඳ එය පසාරු කරගෙන යන ආකාරයේ ඊතලයක් ද ගසා ගෙන රතු මල් පොකුරක් ගෙන තම ආදරවන්තිය බැලීමට ප්‍රේමකුරුල්ලන් ඉගිලී යන්නේ මැයි පෙළපාලියට යන සේය. එම දිනවල කඩ සාප්පු වලද රක්ත වර්ණයෙන් යුත් ඇඳුම් පැළඳුම්, තෑගී භෝග බොහෝය. මේවා රැගෙන පෙම්වතුන් තම පෙම්වතිය සොයා පියඹා යන්නේ තම ආදරය, සෙනෙහස පුද කිරීමටය. පසුව ඔවුන් හුදකලා තැන් සොයා යමින් පෙම්බස් දොඩන්නේ ජීවිතේම කම්බස් නොවන ආකාරයටය. අනේ ඉතින් වර්තමානයේ එසේ සිදු වෙනවා නම් මොනතරම් මනරම් ද?

නමුත් අද පවතින රටේ තත්ත්වය දිහා බැලුවම එසේ සිදුවෙනවාද? ඔවුන් විවාහ ජීවිතයට පෙර සිහින ගීත මුමුණා පවසන්නේ "ඇස් දෙක පියාන නිදාගන්න මට බෑ... ඔය බැල්ම ඔය කැල්ම නිළුපුල්ද නෙතේ... ප්‍රේම ගඟේ මැණික් වගේ අපි දෙන්නගෙ හිතේ තිබූ ආදරේ..." හරියට සත්‍ය ප්‍රේම භූංග රාජයා වගේය. "මුලදී බැන්ද ආදරයක මිහිර දැන් සැනසීම සොයමි මගේ පපුවට තද කරන්" හරියට හෘද වස්තුව බිමට වැටෙන්නට යනවා වගේය. ප්‍රේම ගීත මෙන්ම විරහ ගීත ද නැතුවා නොවේ. මේ ප්‍රේම ලෝකය නිවී ගියාට පසු සමහර අය විවාහ ජීවිතයට පා තබන්නේ සුවිසල් හොටෙල් වලය. රෙජිස්ටාර් ළඟ දිවුරා පොරොන්දු වන්නේ දිවි තිබෙන තුරා එක වහලක් යට ජීවත් වන බවය. ඉන් පසු කැදැල්ලෙ ඇතිවූ කිරිල්ලී ඉගිලී යන්නේ දෙමව්පියන්ගේ ඇස්වලින් ගලන කඳුළු අතරිනි. නමුත් අද පවතින දික්කසාද නඩු වලින් පෙනී යන්නේ විවාහ ජීවිත බොහෝ අසාර්ථක වී ඇති බවය. විවාහ වීමට පෙර පැවසූ මිහිරි වදන් මේ වන විට අමිහිරි වී ඇත. ප්‍රේමා ලෝකයද නිවී ගොස් ඇත. පැවසූ ලව් ගීත ඉලව් වී ඇත. මේ තුළ විරහ ගීත ද නැතුවා නොවේ. විවාහ වීමට පෙර ගැයූ වදන් වෙනස් වී ඇත. පවුල තුළ ඇතිවන ආර්ථික ප්‍රශ්න නිසා මුලදී පැවසූ මිහිරි වදන් අමිහිරි වී ඇත. පෙර දුටු නීල දෑස දැන් වපර වී ඇත. නිවස තුළ පවතින අඩුපාඩුකම් ගැන කතා කරන්නේ කේන්තියෙනි. එවිට ඔහු කිපී "උඹගේ කට වැඩියි ගහනව දත් ඇන්ද ගැලවෙන්න" යැයි පවසයි. ඔහු දැන් සැමියා නොවේ. දත් දොස්තර කෙනෙකි. මුලදී ආදරයෙන් සිපගත් මුව මඬලට පහර දෙන විටෙක ඔහු උගුර කන නාසය බලන වෛද්‍යවරයෙකි. නැතිනම් සර්වාංග වෛද්‍යවරයෙකි. මේවා ඉවසාගෙන සිටීමට බැරිම තැන ගැහැණිය විසින් "මගේ අතපයත් කඩලා දාන්නද හදන්නේ ගැහුවොත් මාත් ගහනවා" කියා පවසයි. එවිට "පිරිමින්ට අත උස්සන්නද අම්මලා උගන්නලා තියෙන්නේ පිරිමින්ට අත උස්සන එක පව්" යැයි ඔවුන් පවසයි. එවිට "එහෙනම් ඔහෙල අත විතරක් නෙමේ පයත් උස්සන්නේ අඩු කඩනවයි කියලා" යැයි ගැහැණුන් පවසයි. දැන් ඉතින් ආදරේට කියන කතා බොළඳ වෙලා, මුලදී බැන්ද ආදරයක මිහිර දැන් හොයන්න වෙලා තියෙන්නේ මගේ පපුවට තද කරන් ප්‍රේමතෝ ජායතී සෝකෝ කියලා තමයි.

සමන්තා

# ප්‍රහේළිකා අංක - 50

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 අ | | 3 | ■ | 5 කු | 6 | |
| | ■ | | | | | ■ |
| | ■ | 4 මා | | | | 7 අ |
| | ■ | | ■ | ■ | 10 | |
| | ■ | ■ | ■ | ■ | | |
| 2 ක | | ■ | ■ | 2 ති | ■ | |
| | ■ | 9 පු | | | | ■ |

## හරහට

1. ගෙදර බුදුන්.
2. කාන්තාවට කියන තවත් නමකි.
4. කරේ බඳින ආභරණයකි.
5. උදේ පාන්දරම හඬලන සතෙකි.
9. පොත් වලට කියන තවත් නමකි.
10. මිනිස් යන පදයට සමාන පදයකි.

## පහළට

1. කම්කරුවෙකු සතු හිමිකම් වලට කියන තවත් නමකි.
3. දිශාව සොයා ගැනීමට උපකාරී වේ.
5. වැසි දින වලදී අවශ්‍ය වන උපකරණයකි.
6. ජයග්‍රහණයකින් පසු ලැබේ.
7. මේවා සිදුකිරීමෙන් අයිතිවාසිකම් දිනාගත හැක.
8. වාක්‍යයක් අවසානයේදී තබනු ලැබේ.

**මෙම ප්‍රහේළිකාව නිවැරදිව පුරවා පහත සඳහන් ලිපිනයට ඒවා මුදලින් රු.1000 ක් වටිනා තෑගි දිනාගන්න.**

**ඬාබිඳු සාමුහිකය**
**221, වෙළබඩ පාර, කටුනායක.**
**දුරකථන අංකය: 077 725 9892**

# මොහොකටද දවසක්?

ඒත්, වෙන් කරපු එක සතුටක්...

ගෑනුන්ගෙ දවසෙ වෙනදට වඩා
ආඩම්බරෙන් කියන්නේ
ඔව්, ගෑනු නැගිටිනවා !

පෙන්නන්න තියෙන දරුණුම දේවල් පෙන්නලා,
ඇහැට ඇඟිල්ලෙනුත් ඇනලා බලපන්
ගෑනු නැගිටිනවා!

හදවතේ දුවන ලේ නහරත් ඇදලා අරන් ඒවට
ගින්දරත් තියලා බලපන් ගෑනු නැගිටිනවා!

අමාරුවෙන් බිම තියන, තියන හැම අඩිය
ගානෙම රත් වුණු අඟුරුත් දාලා බලපන්
ගෑනු නැගිටිනවා!

තමන්ගෙ මිනිහා, තමන්ගෙ ඇස් ඉස්සරහා
වෙන උන් නළවන හැටි අත දික්කරලා
පෙන්නපන් ගෑනු නැගිටිනවා!

කුසින් වදපු දරුවෝ, කිරි ටික මැනලා දුන්නා
වගේ හැසිරෙන හැටි කෑගහලා පෙන්නපන්
ගෑනු නැගිටිනවා!

බිමට තියන දෙපයේ ඇඟිලි ටික පිහියක්
අරන් හතරට පහට ඉරලා බලපන්
ගෑනු නැගිටිනවා!

කොටින්ම කිව්වොත්,

අත තිය තිය හිටගන්න නොදී වට්ටලා බලපන්,
ඒත් සත්තයි ගෑනු නැගිටිනවා!

මොකද,

"ගෑනු කියන්නෙම, අර අහස වගේ, රළු මුහුද
වගේ, මහ පොළව වගේ"

හරි හයිය ජාතියක්...

ඉතින් පතන්නම් මගෙ ජාතියෙ උන්ට
සුබ කාන්තා දිනයක්!

(උපුටා ගන්නා ලදී - තාරිකා ලක්මාලි)

# ජිනීවා 90 වන CEDAW සමුළුවේ ඩාබිඳු



2025 පෙබරවාරි 14 වන දින, කාන්තාවන්ට එරෙහි වෙනස්කම් තුරන් කිරීමේ කමිටුවට (CEDAW) 90 වන සමුළුවේ දී ශ්‍රී ලංකා රජය වසර පහක කාන්තා තත්ත්ව වාර්තාව ඉදිරිපත් කළ අතර, එහිදී කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රධාන කරුණු පිළිබඳව සාකච්ඡා කළේය. ඩාබිඳු සාමූහිකය ඇතුළු කාන්තා සංවිධාන 12ක් සමඟ එක්ව කාන්තාව සහ මාධ්‍ය සංවිධානය විසින් මෙහය වන ලද, කාන්තාවන්ගේ ආර්ථික අයිතිවාසිකම් සහ රැකියා නියුක්තියේ සමානාත්මතාවය පිළිබඳව සාකච්ඡා කරන CEDAWහි 11, 12, 13 සහ 14 වගන්ති කෙරෙහි අවධානය යොමු කරමින් සවිස්තරාත්මක වාර්තාවක් සම්පාදනය කළේය.

ඇඟළුම් කාන්තාවන් මුහුණ දෙන තීරණාත්මක ගැටළු, විශේෂයෙන් ඔවුන්ගේ කම්කරු අයිතිවාසිකම් පිළිබඳව වාර්තා කළ චමිලා තුෂාරි, ස්විට්සර්ලන්තයේ ජිනීවා හි පැවති CEDAW සමාලෝචනය ශ්‍රී ලංකාව නියෝජනය කළාය. ජීවන වැටුප් නොමැතිකම, වෘත්තීය සමිති කඩාකප්පල් කිරීම සහ සංගමයේ නිදහස මර්දනය කිරීම වැනි සේවකයින්ගේ අඛණ්ඩ අරගල මෙහි දී ලේඛනගත කළේය. එසේම ආර්ථික හා ණය අර්බුදය සහ කාන්තාවන්ට එහි බලපෑම පිළිබඳව වාර්තා කළේය.

ඊට අමතරව, කාන්තා හඬ කම්කරු ව්‍යාපාරය තුළ ගිලී යාමත් සමඟ වෘත්තීය සමිති තුළත් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය තුළත් කාන්තා නායකත්වයක් නොමැතිකම වාර්තාව අවධාරණය කළේය. ඊට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකා රජය CEDAW ක්‍රියාත්මක කිරීම පිළිබඳ පස් අවුරුදු වාර්තාවක් ලබා දුන් අතර, රැකියා ලෝකයේ ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර තුරන් කිරීම අරමුණු කරගත් සන්ධිස්ථානීය ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතියක් වන අංක 190 (C190) සම්මුතිය අනුමත කිරීමට රජය දක්වන කැපවීම ප්‍රකාශයට පත් කිරීම මෙම සමාලෝචනයෙන් ලැබුණු සැලකිය යුතු ජයග්‍රහණයකි. මෙම පියවර, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඉදිරියට ගෙන යාම සහ ශ්‍රම බලකායේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ කැපවීමේ තීරණාත්මක සන්ධිස්ථානයක් සනිටුහන් කළේය.



# විරි ඇති කතුන් රටටම භාග්‍යයක්

එදිනෙදා ජීවිතයේ අප පරිභෝජනයට ගන්නා බොහෝ ආහාර අපතේ යන බව අප සියලු දෙනා දන්නා කරුණකි. එමෙන්ම ශ්‍රී ලංකා භූමිය සාරවත් බවින් අනූන තෝතැන්නකි. එබැවින් සාරවත් භූමියන්හි ඖෂධ පැළෑටි මෙන්ම නේක විවිධ පැළෑටි ශාක හටගෙන තිබේ. ඒවායින් නිසි ප්‍රයෝජනයක් ගන්නවාද යන්න ගැටලුවකි. අපේ දේ අගයමින් සියල්ලන්ගෙන්ම උපරිම ඵල නෙළා ගැනීමට සමත් වූ දිරිය ලියක් පිළිබඳවයි අද මේ කතාව. මිසර ප්‍රඩක්ස්හි නිර්මාතෘ වූ ඇය නමින් මලිති ප්‍රියදර්ශනී. කුරුණෑගල ප්‍රදේශයේ පදිංචි වූ ඇය ස්වභාවික ශාක යොදා ගනිමින් සිය ව්‍යාපාරය සිදු කරයි.

ප්‍රබලත්වය, බලගැන්වීම ආදිය ඉස්මතු කරන පරිවර්තනීය ජීවිත කතාවක් ඇති ඇය 2003 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ඇඟළුම් කම්හල් සේවිකාවක් ලෙස ක්‍රියාකර ඇති අතර එම කාලය තුළ ඩාබිඳු සාමූහිකය සමඟින් යහපත් සබඳතාවක්ද ගොඩනගා ගන්නා ලදී. ඩාබිඳු සාමූහිකය යනු ලංකාවේ ඇඟළුම් කර්මාන්ත සේවකයින්ගේ අයිතිවාසිකම් සඳහා නැගී සිටින ඔවුන්ව සවිබල ගන්වන තෝතැන්නකි. එහි සාමාජිකාවක් වීම මලිතිගේ ජීවිතය වෙනස් කළ අතර ඇයගේ ජීවිතයට නැවුම් බලාපොරොත්තු එක් කළ ස්ථානයකි.

සිය පෞද්ගලික ගැටලු හේතුවෙන් 2013 වර්ෂයේ දී ඇඟළුම් කම්හල් සේවිකාවක ලෙස කටුනායක ප්‍රදේශයට පැමිණි ඇය දහදිය බිඳුවල අගය හඳුනන දහදිය කඳුළු මුතු කැට කරන්නට මඟ සලසන ඩාබිඳු සාමූහිකය සමඟ අත්වැල් බැඳගත් ඇය අයිතිවාසිකම් පිළිබඳව අවබෝධයක් සහ විවිධ වූ ස්වයං රැකියාවන් පිළිබඳ දැනුම ලබාගන්නා ලදී. මෙම අත්දැකීම් මලිතිට තීරණ ගැනීමේ හැකියාව නායකත්වය ආදී ගුණාංග වර්ධනය කර ගැනීමට උපකාරී විය.

ඇයගේ ව්‍යාපාරයේ පළමු නිෂ්පාදනය වූයේ හීන් බෝවිටියා තේ පැකට් නිෂ්පාදනයයි. ඇය මෙම ව්‍යාපාරයට යොමු වීමට ප්‍රධානම හේතුව වූයේ ඇය ජීවත් වන ප්‍රදේශයේ බොහොමයක් ප්‍රජාව දියවැඩියාව, කොලෙස්ටරෝල් ආදී බෝ නොවන රෝග වලින් පීඩාවට පත්ව සිටීමයි. එමෙන්ම ඇයගේ සැමියාගේ මවද මෙවැනි රෝගී තත්ත්වයන්ට මුහුණ දුන් නිසා එය යම් කිසි මට්ටමකින් හෝ අඩු කර ගැනීමට විසඳුමක් ලෙස ඇය විසින් මෙය හඳුන්වා දෙන ලදී.

ඇය විසින් මෙම නිෂ්පාදනයන් විජලන ක්‍රියාවලිය හරහා සිදු කරනු ලබයි. විජලන ක්‍රියාවලිය පිළිබඳ පුහුණුව තායි ශ්‍රී ආයතනය හරහා ලබාගත් බව ඇය අපත් සමග පැවසීය. ඇයගේ නිෂ්පාදනයන් ලෙස නිල් කටරොළු, නිල් මානෙල්, මුරුංගා, ගස් ලබු ආදී බොහෝ නිෂ්පාදනයන් පෙන්වා දිය හැකිය. ඇය පවසනු ලැබුයේ ලෙඩ රෝග වලින් තොර නිරෝගිමත් සමාජයක් බිහි කිරීම මෙම ව්‍යාපාරයේ අරමුණ බවයි.

ඇය පවසනා පරිදි ස්වයං රැකියා ව්‍යාපාරයක් තුළින් සමාජ සේවයක් සිදු කිරීමට ඇයට ප්‍රධාන හේතුව වී ඇත්තේ ඩාබිඳු සාමූහිකය සමඟ එක්ව වැඩ කිරීමයි. ඇය සැබැවින්ම දිරිය කතකි. මෙලෙස කාන්තාවන් සිය අනාගත සුබ සිද්ධිය උදෙසා වෙහෙසන ආකාරය ඩාබිඳු අපගේ සතුටට කරුණකි. ඇයගේ ඉදිරි ගමනට අප හදවතින්ම සුභ පතන්නෙමු.

කවීශා වන්නිනායක

අංකඃ 221, වෙළඹඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.